(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 41.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0115/'09

1.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ කලාප අංක 01 යටතට ගැනෙන මොනරාගල, බදුල්ල, නුවරඑළිය සහ රත්නපුර යන දිස්ත්‍රික්කවල සමාජ සුභසාධන ව්‍යාපෘති සඳහා 2006, 2007, 2008 සහ 2009 යන වර්ෂයන්හි දී, වෙන වෙනම කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතීන්හි වැඩ අවසන්කර තිබේනම්, වැඩ ආරම්භ කළ දිනය, වැඩ අවසන් කළ දිනය, ඇස්තමේන්තුගත මුදල හා ගෙවා ඇති මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත ව්‍යාපෘති මගින් ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009 වර්ෂය සඳහා තෝරාගෙන ඇති ව්‍යාපෘති හා ඇස්තමේන්තු කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, මන්ද?

0540/'09

2.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අප රටේ ධීවරයින් විශාල සංඛ්‍යාවක් ඉන්දීය රජයේ අත්අඩංගුවේ පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2009 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ ඉන්දීය රජය විසින් අත්අඩංගුවට ගනු ලැබූ ධීවරයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට අත්අඩංගුවේ පසුවන ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(iii) අත්අඩංගුවේ පසුවන ධීවරයින් නිදහස් කර ගැනීමට ගෙන තිබෙන ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0648/'09

3\.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1999 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වයඹ පළාත් සභාවේ ගිණුම් වාර්තා එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) ඉහත ගිණුම් වාර්තාවලින් අනාවරණය වූ දූෂණ හා වංචාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය පරීක්ෂණ පැවැත්වූයේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම දූෂණ හා වංචාවලට සම්බන්ධ නිලධාරීන් හා අනෙකුත් පුද්ගලයන්ට එරෙහිව ගනුලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තර වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) විනය පරීක්ෂණ නිගමනයන්ට අනුව චූදිත නිලධාරීන් සේවයෙන් පහ කිරීමට කටයුතු කළේද;

(ii) නොඑසේ නම්, චූදිත නිලධාරීන් තවදුරටත් සේවයේ යොදවාගෙන සිටින බලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0651/'09

4\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂයේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය යටතේ මූලධන වියදම් ලෙස වාර්ෂික ඇස්තමේන්තු මුදල හා පරිපූරක ඇස්තමේන්තු අනුව වෙන් වූ මුළු මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් වර්ෂය අවසන් වන විට වියදම් කර ඇති මුළු මූලධන වියදම කොපමණද;

(iii) වියදම් නොකර ඉතිරි වූ මුළු මූලධන මුදල කොපමණද;

(iv) වියදම් නොකර ඉතිරි වූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා සභාවට දන්වන්නෙහිද?

(ආ) ප්‍රයෝජනයට නොගෙන මුදල් ඉතිරිවීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0673/'09

5\.

ගරු විජිත රණවීර මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දකුණු පළාතේ තිබෙන දිස්ත්‍රික් මූලික රෝහල් සංඛ්‍යාව ඒ ඒ දිස්ත්‍රික්කය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දිස්ත්‍රික් මූලික රෝහලක තිබිය යුතු අවම තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත එක් එක් රෝහලේ දැනට පවතින තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් රෝහලේ තිබෙන පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් රෝහල දිස්ත්‍රික් රෝහලක් බවට උසස් කරන ලද්දේ කවදාද;

(ii) ඒ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත එක් එක් දිස්ත්‍රික් මූලික රෝහලේ දැනට පවතින මානව සහ භෞතික සම්පත් හිඟය කවර කාලසීමාවක් තුළ සම්පූර්ණ කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0696/'09

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දිවයින පුරා ක්‍රියාත්මකව පවතින රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන මධ්‍යස්ථාන බලපත්‍රලාභීන්ගේ සහ ආයතන වල නම් සහ ලිපිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) බලපත්‍ර ලබාදී ඇතත්, මේ දක්වා ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන මධ්‍යස්ථානයන් කවරේද;

(ii) එම රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0725/'09

7.

ගරු එම්.ඩී. නාමල් කරුණාරත්න මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2007 වර්ෂයේ දී පැවති සුහද හමුවේදී ඇතිවූ ගැටුමකට අදාළව සාගර හේවාගම මහතාගේ වැඩ තහනම්කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, වැඩ තහනම් කළ දිනය හා ඒ මූලික විමර්ශනයකින් පසුවද;

(ii) එය පැවත්වූ ස්ථානය හා කවරෙකුගේ සහභාගිත්වයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මේ පිළිබඳ වාර්තාවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) ඉහත ගැටුම පිළිබඳව පොලීසියට පැමිණිලිකර ඇත්නම් එහි අංකය කවරේද;

(ii) ඔහුට එරෙහිව ඉදිරිපත්කළ චෝදනා කවරේද;

(iii) දෙවන චෝදනාවට අදාළව විධිමත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) තුන්වන චෝදනාව ඉදිරිපත් වන්නේ මොහුගේ වැඩ තහනමින් පසුව බව එතුමා පිළිගන්නෙහිද?

(ඊ) විනය පරීක්ෂණයේදී ඔහු වැරදිකරු වූයේද යන්න හා විනිශ්චයකරුගේ අවසාන වාර්තාව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඔහුට පෙර චෝදනා තිබේනම්, ඒ කවරේද;

(ii) හිඟ වැටුප් සහ දීමනා සහිතව නැවත සේවයේ පිහිටුවන්නේද;

(iii) ගැටුම්කාරී පරිසරයක් ඇතිකළ අයට එරෙහිව විනයානුකූලව කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0895/'09

8.

ගරු රවි කරුණානායක මහතා,— අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යාංශය වෙත 2007, 2008 සහ 2009 යන වර්ෂ සඳහා වූ ඇස්තමේන්තු මගින් ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් වශයෙන් වෙන් කරන ලද මුදල කොපමණ ද;

(ii) එම වර්ෂ සඳහා ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් වෙනුවෙන් සත්‍ය වශයෙන් ලබාදුන් මුදල කොපමණද;

(iii) එසේ ප්‍රතිපාදන අඩු කර තිබියදී අමාත්‍යාංශයේ කටයුතු මෙහෙයවනු ලැබූයේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) අමාත්‍යාංශයේ සියලුම අමාත්‍යවරුන් වෙනුවෙන් 2007, 2008 සහ 2009 යන වර්ෂ සඳහා වූ ප්‍රවාහන, විදේශ සංචාර, ආපන ශාලා ගාස්තු (දේශීය සහ විදේශීය), ආරක්ෂාව හා සහායකයින් වෙනුවෙන් දරන ලද පිරිවැය සමස්ත වියදම ද ඇතුළුව වෙන් වෙන් වශයෙන් කොපමණ ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0541/'09

9.

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 අයවැය ලේඛනයට අනුව මුළු රාජ්‍ය ආදායම කොපමණද;

(ii) 2009 ජූනි 30 දින වන විට රජයට ලැබුණු මුළු ආදායම කොපමණද;

(iii) 2009 ජූනි 30 වන විට රජය විසින් දරා තිබෙන මුළු විදයම කොපමණද;

(iv) රජය විසින් එසේ වියදම් කරන ලද්දේ කවර වැය ශීර්ෂයන් වෙනුවෙන් කොපමණ මුදලක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0637/'09

10.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර හෙද විද්‍යාලයට බඳවා ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) අවසන් වරට මෙම හෙද විද්‍යාලයට සිසුන් කණ්ඩායමක් බඳවා ගත් වර්ෂය කවරේද;

(iii) එසේ බඳවාගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iv) අවසන් පරීක්ෂණයෙන් පසු මෙම අය කෙදිනක විසිර යන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම කණ්ඩායම විසිර යාමෙන් අනතුරුව නවක කණ්ඩායමක් බඳවා ගන්නේද;

(ii) එසේ නම්, ඒ කෙදිනකට පෙර බඳවා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2006 වර්ෂයේ හෙද ශිෂ්‍ය ශිෂ්‍යාවන් බඳවා ගැනීමෙන් පසුව නැවත බඳවා නොගැනීමෙන් මෙම හෙද විදුහල වසා දැමීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ඈ) රජයේ රෝහල්වල සේවය සඳහා ප්‍රමාණවත් හෙද හෙදියන් සංඛ්‍යාවක් නොමැති තත්ත්වයක් තුළ කවර හේතුවක් නිසා බඳවා ගැනීම් ප්‍රමාද කළේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0652/'09

11.
ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලුනාව කලපුව ප්‍රවර්ධන ව්‍යාපෘතියට ලැබුණු මුළු විදේශ ණය ප්‍රමාණය කොපමණද;

(ii) උක්ත ව්‍යාපෘතියට ණය නොවන විදේශ ආධාර ලැබුණේ නම් එහි මුළු වටිනාකම කොපමණද;

(iii) ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම සඳහා වියදම් කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සැලසුම් කළ ව්‍යාපෘතියට අනුව වැඩ අවසන් නොකළ අංශ කවරේද;

(ii) වැඩ අවසන් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0698/'09

12.
ගරු දයාසිරි ජයසේකර මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "මගනැගුම" ව්‍යාපෘතිය ස්ථාපිත කිරීම සඳහා ඉදිරිපත් කරන ලද 2004.01.21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ස්ථාපිත කර ඇති ආයතන කවරේද;

(ii) මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කර ඇති මගනැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ආයතනයේ වත්මන් සභාපතිවරයාගේ නම හා ඔහුගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) එම සභාපතිවරයාට ගෙවනු ලබන මාසික වැටුප හා වෙනත් දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, ලිපිනයන් සහ ඔවුන් සඳහා ගෙවන ලද වැටුප් හා වෙනත් දීමනා කවරේද,

(ii) එහි විධායක නිලධාරීන්ගේ නම් හා අදාළ තනතුරුද, ඔවුන් ලබන වැටුප්, වේතන හෝ දීමනා කවරේද;

යන්න 2007, 2008 හා 2009 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඉහත ආයතනයට කුළී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව, එක් එක් වාහනය අයත් ආයතනය හෝ පුද්ගලයන් සහ එක් එක් වාහනය සඳහා ගෙවනු ලබන ඉන්ධන දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0897/'09

13.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 ජනවාරි මස 01 වැනි දින සිට මේ දක්වා චීන රජය හෝ චීන සමාගම් මඟින් ශ්‍රී ලංකාව තුළ මෙහෙයවනු ලබන සියලුම ව්‍යාපෘතිවල නම් මොනවාද;

(ii) එම ව්‍යාපෘති මෙහෙයවනු ලබනුයේ ණය පහසුකම් මත ද නැතහොත් හවුල් ව්‍යාපාර ලෙස ද,

(iii) ඉහත ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රභවයන් සහ සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අනුග්‍රහය ඇතිව ගෙන එන ලද දුම්රිය එන්ජින්, යන්ත්‍රෝපකරණ, වාහන, පරිගණක ආදී ද්‍රව්‍ය සහ උපකරණ මොනවාද;

(ii) එකඟ වූ ප්‍රතිපාදන සහ වියදම් කොපමණ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0542/'09

14.

ගරු ජේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 වර්ෂය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකී පරිපූරක ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලද්දේ කවර අවශ්‍යතාවයන් සඳහාද;

(ii) එම ඇස්තමේන්තුවල අගය කොපමණද;

(iii) 2009 අයවැය ලේඛනයේ රාජ්‍ය වියදමට වඩා එය කොපමණ ප්‍රමාණයකින් වැඩිවීමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0643/'09

15.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු මානුෂික මෙහෙයුමෙන් පසු අවතැන්ව, වව්නියාව ප්‍රදේශයේ සුභසාධන මධ්‍යස්ථානවල රැඳී සිටින ජනතාවට ප්‍රමාණවත් සෞඛ්‍ය පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) තුන්ලක්ෂයකට අධික අවතැන් වූ ජනතාව වෙනුවෙන් එම සුභසාධන මධ්‍යස්ථානවල වැසිකිලි කොපමණ සංඛ්‍යාවක් ඉදිකර තිබේද;

(ii) එම සුභසාධන මධ්‍යස්ථානවල දැනට සේවය කරන විශේෂඥ වෛද්‍යවරුන් හා අනෙකුත් වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම මධ්‍යස්ථානවල සේවය සඳහා යොදවා ඇති සහායක සෞඛ්‍ය කාර්ය මණ්ඩලය කොපමණද;

(iv) මේ වන විට එම සුභසාධන මධ්‍යස්ථානවල ජීවත්වන ජනතාවට විවිධ බෝවෙන රෝග වැළඳී තිබේද;

(v) එසේ නම්, එම රෝග වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(vi) එහි සේවය සඳහා යොදවා ඇති වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා සපයා ඇති නවාතැන් පහසුකම් ඇතුළු අනෙකුත් පහසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 1),— අද දින ආණ්ඩුවේ කටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 2),— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 48 විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2009. 05. 26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය.

" මීනුවන්ගොඩ සිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

ගරු රවි කරුණානායක මහතා,— ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අමාත්‍ය ධුරයන් දැරීමෙන් වැළැක්වීම,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2007 ජූලි 06) "ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, තම ඇමතිවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත් ජනාධිපතිවරයා හා අගමැතිවරයා කිසිදු අමාත්‍ය ධුරයක් නොදැරිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 3/'05]

පා. 1/'09

2.

ගරු රවි කරුණානායක මහතා,— අවි ආයුධ ලියාපදිංචි කිරීම,— ශ්‍රී ලංකාවේ පවතින සියලුම අවි ආයුධ ලියාපදිංචි කළ යුතු අතර, එසේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව යම් කිසිවෙකු ලියාපදිංචි නොකළ ආයුධයක් ළඟ තබා ගෙන අසුවුවහොත්, අපරාධ නීතිය උල්ලංඝණය කිරීමේ වරද යටතේ ඔහුට එරෙහිව නඩු පවරා, අවුරුදු 20 ක අනිවාර්ය සිර දඬුවමකට යටත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 2/'09

3.

ගරු රවි කරුණානායක මහතා,— බැංකු ගනුදෙනු වේලාවන් දීර්ඝ කිරීම,— රටේ ආර්ථික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා බැංකු ගණුදෙනු වේලාවන් පැය 9.00 සිට පැය 16.00 දක්වා දීර්ඝ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 3/'09

4.

ගරු රවි කරුණානායක මහතා,— කෝට්ටේ ඡන්ද කොට්ඨාසය තුළ පවතින සියලුම තැබෑරුම් වසා දැමීම,— රිසි සේ මත්පැන් විකිණීම මෙරට සදාචාරාත්මක වටිනාකම් පිරිහීමට හේතු වී ඇති බැවින්, කෝට්ටේ ඡන්ද කොට්ඨාසය තුළ පවතින සියලුම තැබෑරුම් වසා දැමීමට නීති පැනවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 4/'09

5.

ගරු රවි කරුණානායක මහතා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට සහභාගී වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබාදීම,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වය තුළින් එම සාකච්ඡා වඩාත් ඵලදායී, අර්ථවත් හා විනිවිදභාවයකින් යුක්ත වනු ඇති බැවින් මාධ්‍යවේදීන්ට එම රැස්වීම්වලට සහභාගී වීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 5/'09

6.

ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට කෘෂිකාර්මික ණය ලබා දීම,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට 5% ක අඩු පොළී අනුපාතයක් මත රු. 250,000 උපරිමයකට යටත්ව කෘෂිකාර්මික ණය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 6/'09

7.

ගරු රවි කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 7/'09

8.

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 8/'09

9.

ගරු රවි කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 9/'09

10.

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 10/'09

11.

ගරු රවි කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 11/'09

12.

ගරු රවි කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුළත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'09

13.

ගරු රවි කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'09

14.

ගරු රවි කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'09

15.

ගරු රවි කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'09

16.

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'09

17.

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 17/'09

18.

ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් නීතිගත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා " තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'09

19.

ගරු රවි කරුණානායක මහතා,— "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට ඍජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'09

20.

ගරු රවි කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'09

21.

ගරු රවි කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'09

22.

ගරු රවි කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'09

23.

ගරු රවි කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ථ වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 23/'09

24.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් වහාම ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව වහාම ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'09

25.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පෞරාණික, සංස්කෘතික, සමාජමය වටිනාකමක් ඇති ස්ථානවල තොරතුරු ලබා ගත හැකි හා කෞතුක භාණ්ඩ සඳහා කෞතුකාගාරයක් පිහිටුවීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'09

26.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ජාතික ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'09

27.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ස්ත්‍රී අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'09

28.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණ ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් ඇතුළු විවිධ දක්ෂතා ඇති පුරවැසියන්ට තම නව නිපැයුම් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩපිළිවෙලක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'09

29.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'09

30.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීම,— සමාජයෙහි ව්‍යාප්තව යමින් පවතින අපරාධ අඩු කිරීමත්, අපරාධ නීති පද්ධතියේ පවතින අඩුපාඩු අඩුකර අපරාධ නීතිය සංශෝධනය කිරීමත් අධිකරණය තුළ ගොඩගැසී ඇති ඉඩම් නඩු ඇතුළු නඩු විභාග අවසන් කිරීම හා අධිකරණය, පොලිසිය හා බන්ධනාගාර නවීකරණය කර කඩිනම් සේවයක් ලබා දීම සඳහාත් අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'09

31.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'09

32.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'09

33.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩපිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'09

34.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි ඇතුලු ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම,— රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි ඇතුලු ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම සඳහා වෘත්තීමය සුදුසුකම් හා පලපුරුද්ද ඇති පුද්ගලයන් පමණක් තෝරා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'09

35.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ග්‍රාම නිලධාරි වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා පරිපාලන ප්‍රදේශයන්හි සීමාවන් විද්‍යාත්මක පදනමක් මත යළි නිර්මාණය කිරීම,— දිවයින පුරා නැවත සමීක්ෂණයක් කර ග්‍රාම නිලධාරි වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා පරිපාලන ප්‍රදේශයන් හි සීමාවන් විද්‍යාත්මක පදනමක් මත යළි නිර්මාණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/'09

36.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ දී සීමිත තරග විභාග ලකුණු මත පමණක් තීරණය කිරීම,— ශ්‍රී ලංකා විදේශ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ දී සීමිත තරග විභාග ලකුණු මත පමණක් තීරණය කර සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පිළිබඳව පමණක් සොයා බැලීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 37/'09

37.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අපරාධ කරන පාර්ශ්වයට දඬුවම් දීම හා ඉන් හානියට පත් වන පාර්ශ්වයට වන්දි ලබා දීම,— අපරාධ කරන පාර්ශ්වයට දඬුවම් දීම හා ඉන් හානියට පත් වන පාර්ශ්වයට වන්දි ලබා දීම එකම අධිකරණයක් තුළ දී කළ හැකි වන අයුරින් නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 38/'09

38.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'09

39.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්,— අතීතයේ සිට මේ දක්වා ජනතාව තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'09

40.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'09

41.

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 43/'09

42.

ගරු විජිත රණවීර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශිලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

*43.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විමසා සාදන ලදුව, 2009 සැප්තැම්බර් මස 03 වැනි දිනැති අංක 1617/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*44.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පාංශු සංරක්ෂණ පනත යටතේ නියෝග,— (450 වැනි අධිකාරය වූ) 1951 අංක 25 දරන පාංශු සංරක්ෂණ පනතේ 4 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, පාංශු සංරක්ෂණ පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා වන 2009.10.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*45.

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා,— සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත යටතේ නියෝගය,— 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ 11 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා විසින් සාදනු ලැබ, 2009 මැයි මස 19 දින, අංක 1602/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.09.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*46.

ප්‍රවාහන අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ නියෝගය,— 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 46 (ඌ) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 44 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යතුමා විසින් පනවන ලදුව 2009 මැයි මස 29 දිනැති අංක 1603/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.09.10 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*47.

ග්‍රාමෝදය මණ්ඩල පනත (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*48.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනාව,— 1959 අංක 8 දරන පනතින් ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද, සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2009 නොවැම්බර් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

*49.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*50.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*51.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*52.
රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*53.
ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*54.
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*55.
ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*56.
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*57.
ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*58.
ප්‍රත්‍යාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*59.
බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*60.
අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*61.
සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*62.
ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*63.
සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*64.
සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*65.
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*66.

මැතිවරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*67.

නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 145— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන හත්සිය පනහකට (රු. 750,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | |
|---|---|---|
| ශීර්ෂය | 145 | — නැවත පදිංචි කිරීම හා ආපදා සහන සේවා අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — සංවර්ධන ක්‍රියාකාරකම් |

| | | |
|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. | 750,000,000 |
| | රු. | 750,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 නොවැම්බර් මස 03 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 25 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 24 දක්වා එකතුව රු. 87,606,003,938.

*68.

අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යතුමා විසින් සෙස් බදු සම්බන්ධයෙන් 2009 ජූලි මස 31 වැනි දින පනවන ලදුව, අංක 1612/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.11.03 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය..

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*69.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— ශාක ආරක්ෂණ පනත යටතේ නියෝග,— 1999 අංක 35 දරන ශාක ආරක්ෂණ පනතේ 12 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 ඔක්තෝබර් මස 14 වැනි දිනැති අංක 1623/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.11.03 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*70.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*71.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*72.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*73.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*74.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ බදු පනත යටතේ වූ නියෝග,— 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 21 වැනි වගන්තිය යටතේ සිගරැට්, සුරුට්ටු, බීඩි හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූලි මස 17 වැනි දිනැති අංක 1610/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10. 08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*75.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*76.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*77.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*78.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*79.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*80.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*81.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*82.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*83.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

84.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

85.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

86.

පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

87.

මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

88.

කම්කරු නිලධාරීන්ගේ සංගමයේ සුභසාධක අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

89.

ප්‍රේමදාස කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

90.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

91.

සම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

92.

ශ්‍රී ලංකා කුඩා කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

93.

අල්හාජ් එස්. එම්. හුසේන් පුණ්‍යාය භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

94.

මහින්දානන්ද අලුත්ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

95.

ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

96.

සමෝදා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

97.

ග්‍රාස්රූට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.